# තෝරාගත් පුස්කොළ පොත් ඇසුරින් හෙළිවන වෛද්‍ය ප්‍රතිකර්ම පිළිබඳ විමර්ශනයක්

(කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්කොළ පොත් අධ්‍යයන හා පර්යේෂණ පුස්තකාලය ඇසුරින්)

එම්.ටී.ඩී. පෙරේරා

ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

darshikaperera18@gmail.com

ප්‍රමුඛ පදඃ පුස්කොළ පොත්, විෂ වෙදකම, ඖෂධ, මන්ත්‍ර

## හැඳින්වීම

ඉතිහාසය ගොඩනැඟෙන්නේ මූලාශ්‍රය පදනම් කරගනිමිනි. ඒ අනුව අතීත ප්‍රෞඪත්වය විද්‍යමාන කරන පුස්කොළ පොත්, සංස්කෘතික අනන්‍යතාව මෙන්ම අතීතය හා වර්තමානය පිළිබඳව ද තොරතුරු රාශියක් ගෙනහැර දක්වයි. ලෝකයේ අන් කිසිදු ශිෂ්ටාචාරයක් හා සම කළ නොහැකි අද්විතීය උරුමයක් හා අනන්‍යතාවක් ශ්‍රී ලාංකිකයන් සතුව පවතී. මෙම අනන්‍යතා ලක්ෂණ ප්‍රකට කරන වැදගත් ක්ෂේත්‍රයක් වන්නේ පරපුරෙන් පරපුරට දායාද වෙමින් පැමිණි දේශීය වෙදකම යි.

**'දේශීය වෙදකම'** යන වදන ඇසුණු සැනින් සිහිපත් වන්නේ පුස්කොළ පොත් ය. ඒ තරමට ම පුස්කොළ පොත් බොහොමයක් ම දේශීය වෙදකම අළලා රචනා කරනු ලැබ ඇති අතර ඒවා දෙවැනි වූයේ ධර්මය සම්බන්ධව ලියැවී ඇති පුස්කොළ පොත්වලට පමණි. දේශීය වෙදකම භාරතීය ආයුර්වේදයට බෙහෙවින් සමාන ලක්ෂණ විද්‍යමාන කරනු ලැබූ නමුත් ලංකාවේදී ම ප්‍රභවය ලබා ක්‍රමික විකාශනයකට ලක් වූ, පරම්පරාවෙන් පරම්පරාවට උරුම වෙමින් පැමිණි ශාස්ත්‍රයකි. ආයුර්වේද වෛද්‍ය ක්‍රමය පැමිණීමට පෙර මෙරට තිබූ දේශීය වෛද්‍ය ක්‍රමයේ අංගයන්ගෙන් දැනට ඉතිරිව තිබෙන්නේ සුප්‍රසිද්ධ කැඩුම්-බිඳුම්-හන්දි වෙදකම, ඇස් වෙදකම, ගෙඩි වෙදකම, විෂ වෙදකම යනාදියට අයත් ඖෂධ හා ඇතැම් ප්‍රතිකාර ක්‍රමයෝ වෙති.

## ක්‍රමවේදය

ශ්‍රී ලාංකේය ජනතාවගේ වටිනා සංස්කෘතික උරුමයක් වන පුස්කොළ පොත් මතුවටත් ආරක්ෂා කරගනු පිණිස, තෝරාගත් පුස්කොළ පොත් දෙකක් පරිශීලනය කරමින් එහි සඳහන් සර්ප විෂ හා වෙනත් සත්ව විෂට අතීතයේදී සිදු කරන ලද ප්‍රතිකර්ම කෙබඳුද යන්න පුස්කොළ පොත්වල සඳහන් කර ඇති අයුරු විමසා බැලීම මෙහි අරමුණ විය. මෙහිදී ක්‍රමවේදය ලෙස කැලණිය විශ්ව විද්‍යාලයේ සමාජීයවිද්‍යා පීඨයේ පුස්කොළ පොත් අධ්‍යයන හා පර්යේෂණ පුස්තකාලය සතු, පිළියන්දල මංජුල හේවගේ විසින් පරිත්‍යාග කරන ලද පුස්කොළ පොත් එකතුව ඇසුරින් තෝරාගන්නා ලද බෙහෙත් වට්ටෝරු පොත් දෙකක් අධ්‍යයනය කරනු ලැබී ය. එහි ඇතැම් කරුණු පැහැදිලි කරගැනීමටත්, ඒවා පුළුල්ව සාකච්ඡා කිරීමටත් ද්විතියික මූලාශ්‍රය කිහිපයක් ද අධ්‍යයනය කරනු ලැබී ය.

**පර්යේෂණ ප්‍රතිඵල**

දේශීය වෙදකම පරිසර හිතකාමීත්වය හා මානව හිතවාදීත්වය එක්තැන්ව විශේෂ බලයක් ගොඩනැගෙන අවස්ථාවකි. සර්ප විෂට සිදු කරන ප්‍රතිකාර ක්‍රමය මන්ත්‍ර, ගුප්ත විද්‍යාව හා ඖෂධ වට්ටෝරු මුසු වූවකි. මෙම පුස්කොළ පොත්වල එන තොරතුරු අතර ඉෂ්ටානිෂ්ට, දූත ක්‍රියා නිමිති, දූතාක්ෂර නිමිති, දූත ප්‍රතිකාර, නිමිති ලක්ෂණ, ආතුර ලක්ෂණ, අෂ්ට නාගයින්ගේ වැළඳීම, යක්ෂණියන්ට දොළ දීම, මන්ත්‍ර විධි මගින් විෂ බැස්වීම, සර්ප විෂට ඖෂධීය පිළියම්, වෙනත් සත්ව විෂට ප්‍රතිකාර හඳුනාගත හැකි ය. එමගින් දෂ්ට කරන ලද සර්පයා හඳුනාගැනීම මගින් සුදුසු ප්‍රතිකර්ම සිදුකිරීමට දේශීය වෙදකමේ හැකියාව පවතී.

සර්ප දෂ්ටයකට මුහුණ පෑ රෝගියා වෙත වෙදැදුරා කැඳවාගෙන යාමට පැමිණෙන දූතයා දෙස බලා එම රෝගියා සුව කළ හැකි ද නොහැකි ද යන්න තීරණය වේ.

**"මසාවිසාඛා සිවමූලඬාත්‍රා සපජී ගණිහෙ පාපබගාහයු කෙත් සවිෂටි රිකතා ගුලිකෙසු සපජී දෂෙටා ගතා සූයඞීම රක්ෂිතොපි… යනු හෙයින් මහත කත් විෂා අද මුල රෙහෙන අස්ලිස කැති යන මේ නකත් හා අසුභ ග්‍රහයන්ගේ දිනය හා යුකත කලහී විෂටි සහිත වූ රිකතා ගුලි කා ඇති කලහී යමෙක් සපජීයන් විසින් දෂට කලේද ඕ හට යමයා විසින් අරගෙගණ සිටියේ වී ණමුත් සිදිනා ලද ආයුෂ වණෙණය… (PAC 008,2,ක)**

රෝගියාගේ සාධ්‍යාසාධ්‍යතාව පරීක්ෂා කිරීමේදී ජ්‍යොතිෂ්‍යානුකූලව අමෘත කලාව, විෂ කලාව හා මරු කලාව යොදා ගනී. සර්ප දෂ්ටයට හා විෂ නැගීම හා බැසීමට චන්ද්‍ර කලාව බොහෝ බලපායි. මෙම චන්ද්‍ර කලාවට අයත් තිථි අනුව විෂ අඩු වැඩි වේ. විසේනිය, අටවක, නවවක, තෙළෙස්වක, අමාවක, පසළොස්වක යන තිථීන් සර්ප දෂ්ටනයක් අසාධ්‍ය වන ඉතාම අසුභ තිථි ලෙස හැඳින්වේ. ජ්‍යොතිෂයේ ඇති නැකැත් 27න් 20ක්ම සර්ප දෂ්ටයන්ට අසුබ වේ. අස්විද, බෙරන, කැති, රෙහෙන, මුවසිරස, අද, අස්ලිස, පුවසල, සා, විසා, දෙට, මුල, සුවණ, පුවපුටුප යන නැකැත්වලදී ද අසාධ්‍ය වන්නේ යයි අනුමාන කරනු ලැබේ.

සර්ප දෂ්ටනයක් වූ විට ඒ බව පැවසීමට එන පුද්ගලයා දූතයකු ලෙස ගෙන ඔහු සිටින ඉරියව්ව අනුව, කතා කරන විලාශය අනුව, තෙපළන වදන් අනුව දූත ක්‍රියා නිමිති හඳුනා ගැනීමෙන් සර්ප දෂ්ටනයේ ස්වභාවය අවබෝධ කරගැනීමට වෙදැදුරාට හැකියාව ලැබේ.

**"සන්ධ්‍යා නාම් ත්‍රිතයේ චෛව දේවා යත්න චත්වරෙ ශ්‍රිංසාට කේසූත්‍ය ග්‍රහේවාල්මී කොඹ්‍යාන කෝෂ්ටකේ… සවසානේ ග්‍රාම චෛත්‍ය වාසංගමේසරිතාමපී එව මාදි ප්‍රදේස සේ සුතුතං විද්‍යාත්කාල දෂටකං…" (PAC 008,2,ක)**

රෝගියාගේ සාධ්‍ය හෝ අසාධ්‍ය බව තේරුම් ගැනීමට දෂ්ට කළ ස්ථානය වැදගත් වේ. වනාන්තර, තුඹස, ගං ඉවුරු, අවන්හල්, තෘණ භූමි, තුන්මංසල් යන ස්ථානයන්හිදී දෂ්ටනයක් වුවහොත් අසාධ්‍ය යැයි වෛද්‍යවරයා දැනගනියි. ඉර මුදුන් වෙලාව, ගොම්මන, මධ්‍යම රාත්‍රිය, අලුයම විෂ නගින වෙලාවල් ලෙසත්, කාල දෂ්ට ගණයට අයත් ස්ථාන කිහිපයක් ද සඳහන් වේ.

තවද රෝගියාගේ තොරතුරු පවසන දූතයා සිටින දිශාව අනුව බොහෝ දෑ උපකල්පනය කරයි. දූතයා නැගෙනහිරට පිටුපා තොරතුරු පවසන්නේ නම් නයකු බව ත්, ගිනිකොණ වයඹ දිශාවේ සිට නම් නිර්විෂ සර්පයකු බවත්, බටහිර සිට පවසන්නේ නම් කරවැලෙකු බව ත්, ඊසානදිග සිට නම් ගෝනුසු වැන්නකු බව ත්, නිරිත දිශාවේ සිට පවසන්නේ නම්

පොළොං තෙලිස්සකු බව ත් දැන ගත් බව සඳහන් වේ.

දූතයා තොරතුරු පවසන්නේ උඩ බලාගෙන නම් මීයකු බව ත්, බිම බලා නම් රත්වායා බව ත්, ඇවිදිමින් නම් ගැරඬියා බව ත්, හුන් තැන සිටම නම් නාගයා බව ත්, හිස අතගාමින් නම් මාපිලකු බව ත්, මුහුණ අතගාමින් නම් නාගයා බව ත්, බඩ හෝ අත හෝ දණහිස අතගාමින් තොරතුරු පවසන්නේ නම් පොළඟෙකු බව ත්, තුනටිය අතගාමින් නම් කරවලකු බව ත්, පිට හෝ වැලමිට අතගාමින් නම් පොළොං තෙලිස්සකු බව ත්, සන්සුන්ව නම් නිර්විෂ සතකු බව ත් ආදී වශයෙන් බොහෝ ලක්ෂණ අනුව රෝගියා පිළිබඳ තතු වෛද්‍යවරයා දැනගන්නා බව සඳහන් වේ.

රෝගියාගේ තොරතුරු පවසන දූතයා වෙදැදුරු වෙත පවසන වැකිය අනුව බොහෝ දෑ තේරුම් ගැනීමට වෙදැදුරුට හැකියාවක් තිබුණි. ඒ වැකියේ හල් අකුරු ඉවත් කිරීමෙන් අවසන් අකුර තෙක් ඇඟිලි ගැනීමෙන් අවසන් අකුර හිමි ඇඟිල්ල අනුව දෂ්ට කරන ලද සර්පයා පිළිබඳ අවබෝධයක් වෛද්‍යවරයා ලබා ගනී. කනිටු හෙවත් සුලඟිල්ල නම් නයෙකු ද, වෙදඟිල්ල නම් පොළඟෙකු ද, මැදඟිල්ල නම් පොළොං තෙලිස්සකු වැනි සතෙකු ද, දබර ඇඟිල්ල නම් කරවල් වර්ගයට අයත් සතුන් ද, මහපට ඇඟිල්ල නම් නිර්විෂ සතෙකු බවට ද වෙදැදුරු තෙමේ දැන ගන්නා බව දැක්වේ.

ඉරිදා, අඟහරුවාදා සහ සෙනසුරාදා දිනයන් සර්ප දෂ්ටනයට අසුභ දවස් ලෙස සලකා තිබේ. සර්පයා දෂ්ට කළ දවස අනුව පැවසිය යුතු මන්ත්‍ර තිබේ. සර්ප දෂ්ටයන් සුවය අත්කර ගැනීම අරමුණු කරගෙන අෂ්ට නාගයින්ගේ දළ හතරේ යක්ෂණීන්ට සිදු කරන ලද වත් පිළිවෙත් සහිත දොළ පිදීම් පිළිබඳ පැහැදිළිව සඳහන් වේ.

විෂ වෙදකමේදී යොදාගන්නා දෙවියන් හා බුදුන් අන්තර්ගත කර සකස් කළ ආනුභාවසම්පන්න මන්ත්‍රවල **'ඕං'** යන්නෙන් **'දෙවියන්'** හා **'නමෝ'** යන්නෙන් **'බුදුන් වහන්සේ'** අර්ථවත් වේ.

විෂ වෙදකමේදී විෂ සහිත සතුන්ගේ විෂ නැසීම සඳහා විවිධ ඔසු ශාක භාවිත කිරීම දැකගත හැකි ය. එසේ ම සර්පයා දෂ්ට කළ මුඛයේ ඇති විෂ සහිත අපිරිසිඳු රුධිරය කුඩැල්ලන් මගින් ඉවතට ගැනීම ද ඉතා වැදගත් ප්‍රතිකර්මයක් ලෙස සඳහන් වේ.

**"දිවිමකුළුවාට දිවි සම් පුළුසසා මකුනුවැනන කොල අඹරා තල තෙලිං ගානු෴"** **(PAC 008,1,8)**

**"ගෝනුස්සාට ගැට තුඹ කොටා ගානු෴"(PAC 010,1,5)**

ශාක ඔසුවලට අමතරව හාවාගේ දිව, ඌරු පිත ආදිය ද එක් කර සුනඛ රුධිරය යොදා ගන්නා බව කියැවේ. මෙය සර්ප විෂ ඇසිල්ලකින් නසන දිව්‍ය ඖෂධයක් බව ද සඳහන් වේ. බෙහෙත් වට්ටෝරුවලින් විෂ මූර්ජා වී ඇති රෝගියෙකු නැවත ජීවත් කරවිය හැකි ය.

**"උග්‍ර ගන්ධ පාරද තල සිවිස හර මූලේත නශ්‍ය යොගේන සදොසලහතේ ප්‍රානං ගතෝ පියමසාදතේ නෂටඃ෴යනු හෙයින් වදකසා රසදිය තලා මුල් සක්සඳ මුල් මේ හැම අඹරා මුත්‍ර දියෙන් නස්න කරනු යම පුරට ගියාහුද ජීවත් වන්නේය,෴"(PAC 008,2,කඃ)**

සර්ප දෂ්ටයට ප්‍රතිකාර ලෙස යොදාගන්නා තල තෙල් පහනේ දළු ගණන අනුව සර්පයා තීරණය වේ. සර්ප දෂ්ටයෙන් පසු දල්වන තල තෙල් පහන්වල දැල්ල නිවා දමා ඉන් නැඟෙන දුම්, විෂ බැස්වීම සඳහා යොදා ගැනේ.

විවිධ විෂ සඳහා ලබාදෙන කැඳ වර්ග සඳහන් වේ.

**"එල කටරොළුඩු කුප්පමෙනි කොල කුඹුරු කොලත් මිරිකාගෙන හීනටි හාලෙං කැඳ පිශ දෙනු බඩෙ විශ පත්තු නොවෙයි෴"(PAC 010,3,5කු)**

මේ ආකාරයට විෂ වෙදකමේ දී විෂ හඳුනාගැනීමේ සිට ප්‍රතිකාර කිරීම දක්වා ක්‍රමවත් හා ඉතා දියුණු දේශීය වෛද්‍ය ශාස්ත්‍රයක් පැවති බව හඳුනාගත හැකි විය.

## සමාලෝචනය

වර්තමානය වන විට විෂ වෙදකම ක්‍රමයෙන් පරිහානියට යමින් පවතින වෛද්‍ය ක්‍රමයකි. ඊට ප්‍රධාන ම හේතුව වී ඇත්තේ පාරම්පරික දේශීය වෛද්‍ය ශාස්ත්‍රය අභාවයට යාමයි. අතීතයේදී සර්ප විෂ හා වෙනත් සත්ව විෂ නැසීම සඳහා පිළියම් ලෙස නස්න කිරීම, දෂ්ට කළ තුවාල මුඛයේ ඖෂධ ගුලි අඹරා ආලේප කිරීම, ඖෂධීය පාන වර්ග ලබා දීම, මන්ත්‍ර මගින් විෂ කැපීම ඇතුළු දියුණු වෛද්‍ය ක්‍රම රාශියක් පාරම්පරිකව පැවති බව පුස්කොළ පොත් ඇසුරින් සිදුකළ පර්යේෂණයේ දී පැහැදිලි විය.

## ආශ්‍රිත ග්‍රන්ථ


*බෙහෙත් වට්ටෝරු පොතක්,* පිළියන්දල මංජුල හේවගේ මහතාගේ පුස්කොළ පොත් එකතුව.( PAC 008).පුස්කොළ පොත් අධ්‍යයන හා පර්යේෂණ පුස්තකාලය. කැලණිය විශ්වවිද්‍යාලය.

*බෙහෙත් වට්ටෝරු පොතක්,* පිළියන්දල මංජුල හේවගේ මහතාගේ පුස්කොළ පොත් එකතුව.( PAC 010).පුස්කොළ පොත් අධ්‍යයන හා පර්යේෂණ පුස්තකාලය. කැලණිය විශ්වවිද්‍යාලය.

රාමනායක, ලීලා. (2016)*පෙරදිග වෙද පුරාණය.*රාජගිරිය: කුරුලු පොත් ප්‍රකාශන.

අධිකාරි, පුලස්ති. (2017.ජුනි-ජුලි)*දේශීය පාරම්පරික සර්ප විෂ වෙදකම.* මහාමේඝ.

ප්‍රියදර්ශනී, චතුරිකා. (2013.08.24)*රසගුණ පිරි කොළ කැඳ.* දිවයින.